# ඇබෑර්තු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

## (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ සංස්ථාපිත)

# ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

ඉහත සඳහන් තනතුර සඳහා වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර/රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට වයස් සීමාව බලපාන්නේ නැත. අයදුම්කරු නායකත්වයේ ගුණාංග සහිත ප්‍රජාතාන්ත්‍රික අගයන් සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ අවබෝධයක් ඇති උද්යෝගීමත් පුද්ගලයකු විය යුතුය. ඔහුට/ ඇයට රාජ්‍ය භාෂාවන් අතුරෙන් එකක හා ඉංග්‍රීසි භාෂාවෙහි විශිෂ්ට සංනිවේදන නිපුණතා තිබිය යුතුය.

තනතුරට AR 2 - 2016 (රු.76,200 - 10X2,000 - 96,200) වැටුප් පරිමාණයක් හිමිය.

කළමනාකාර සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ AR 2 ට යටත්ව සහ සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වරප්‍රසාද හිමිවේ.

තනතුර වසර දෙකක නිශ්චිත කොන්ත්‍රාත් කාලයකට වන අතර, කොමිෂන් සභාවේ තීරණය පරිදි තවදුරටත් දීර්ඝ කිරීමේ හැකියාවද ඇත.

**අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්**

01. සමාජයීය විද්‍යා, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් **සමඟ**

    අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණයන්ට අදාළ වූ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

    **සහ**

    ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

02. සමාජයීය විද්‍යා, ජනමාධ්‍ය හෝ නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් (PhD). **සහ**

    ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

    කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

    අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සමඟ ඥාතීන් නොවන නිර්දේශ කරනු ලබන්නන් දෙදෙනෙකුගේ විස්තරද සහිතව තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2020.09.30 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**බ්ලොක් 2, කාමර අංක 203-204,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,**
**බෞද්ධාලෝක මාවත , කොළඹ 07.**
**විද්‍යුත් තැපෑල - rti.commission 16@gmail.com**